


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙහි පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පි (වඩු කාර්මික) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : අධීක්ෂණ නිළධාරීන් විසින් පවරනු ලබන දොර, ජනෙල්, මේස පුටු හා අනෙකුත් භාණ්ඩ සෑදීම, වහළවල් තැනීම, උළු හෝ ෂීට් ඇතිරීම, දැව සාම්පල් තේරීම, කොන්ක්‍රීට් අච්චු (ෂටරින්) සෑදීම, සිවිලිම් සවි කිරීම, පාර්ටිෂන් බිත්ති සෑදීම, වැහි පිහිළි සවි කිරීම, පලංචි සවි කිරීම ආදී වඩු වැඩ ඇතුළු වෙනත් දෑ කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) වඩු කාර්මික වැඩ කිරීමේදී ජව බලයෙන් සහ විදුලි බලයෙන් ක්‍රියා කරන වඩු වැඩ යන්ත්‍ර සහ උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම හා නඩත්තු කිරීම.

(II) වහලවල්, සිවිලිම් ආදිය කඩා ඉවත් කිරීම.

(III) එදිනෙදා පවරනු ලබන වැඩ හා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳව වාර්තා තබා ගැනීම.

(IV) අධීක්ෂණ නිළධාරීන් නොමැති විට පණිවුඩ භාර ගැනීම සහ අප්‍රමාදව එය ඔවුන්ට ලැබීමට සැලැස්වීම.

(V) රාජකාරී ඉටු කිරීම සඳහා විටින් විට නිකුත් කරන උපකරණ සහ ද්‍රව්‍ය වල වගකීම දැරීම.

(VI) රාජකාරී කාලය තුළ නිල ඇඳුමින් සැරසී සිටීම, එහි පිරිසිදු භාවය ගැන සැළකිලිමත් වීම හා රාජකාරී ස්වභාවය අනුව ආරක්ෂක ආවරණ පැළඳ සිටීම.

(VII) සේවා මුර ක්‍රමය යටතේ සහ හදිසි අවශ්‍යතා මත පවරනු ලබන අතිකාල වැඩෙහි යෙදීම.

(VIII) ස්වකීය භාරයේ පවතින භාණ්ඩ හා උපකරණ පිරිසිදුව හා ආරක්ෂාකාරීව භාවිතා කර නැවත බාර දීම.

(IX) අත් උදව්කරුවන් නොමැති අවස්ථාවලදී, ගබඩාවෙන් උපකරණ හා අමුද්‍රව්‍ය ලබා ගැනීම, වැඩ කරන ස්ථානයට ඒවා රැගෙන යාම සහ උපකරණ හා ඉතිරි ද්‍රව්‍ය නැවත ගබඩාවට භාරදීම.

(X) පලංචි බැඳීම සඳහා බඩු භාර ගැනීම, පලංචි සවි කිරීම සහ ගැලවීම හා ඒවා නැවත භාරදීම.

(XI) කටුනායක ගුවන්තොටුපොල පරිශ්‍රයෙන් බැහැර රත්මලාන, පිදුරුතලාගල, කතරගම, මත්තල හෝ වෙනත් ඕනෑම දුර බැහැර ස්ථානයන්හි අදාළ රාජකාරී ඉටු කිරීම.

| | | | |
|---|---|---|---|
| **සුදුසුකම්** | : | (අ) | ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වඩු කාර්මික ක්ෂේත්‍රයේ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය සහතිකයක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.<br>**හෝ**<br>ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තීය සහතිකයක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.<br>**සහ** |
| | | (ආ) | ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලා කාල සීමාවද / පුහුණු කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම. |
| **වයස** | : | | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| **වැටුප** | : | | තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ. |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | : | | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**පොදු කරුණු :-**

මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් **"සභාපති, ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක" යන ලිපිනයට 2025 මාර්තු මස 04 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (වඩු කාර්මික) 11 වන ශ්‍රේණිය** ලෙස සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාළ සහතිකවල ඡායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 23/02/2025**